හදට ගල් ගැසූ කොල්ලෙක්

First Print - 2023 December
Second Print - 2023 July
Third print - 2023 September

පිටකවරයේ නිමාව
කලන ගංගනාත්
පරිගණක පිටු සැකසුම
කාවින්ද්‍යා රත්නායක
සෝදුපත් පරීක්ෂාව
අකිලා නදිගානි බණ්ඩාර
අශෝක කුලතුංග
මුද්‍රණය
නියෝ ග්‍රැෆික්ස් පුද්ගලික සමාගම,
44, උඩහමුල්ල දුම්රියපොළ පාර,
ගංගොඩවිල, නුගේගොඩ.
0112 820 220 | info@neo.lk
ප්‍රකාශනය හා බෙදාහැරීම
පොත් මී ප්‍රකාශන
Muthumudalige Holding Pvt Ltd.
K Cyril C Perera Mw
Kotahena, Coombo 13
All rights reserved.

Copyright © 2022 by Muthumudalige Nissanka
Published By PothMee (Muthumudalige Holding's pvt Ltd)

ISBN : 978-624-5552-09-2
No part of this publication may be reproduced, distributed, or transmitted in any form or by any means, including photocopying, Scan, recording, or other electronic or mechanical methods, without the prior written permission of the publisher/ Authour, except as permitted by Sri Lanka copyright law. For permission requests, contact Muthumudalige Nissanka or Muthumudalige Holding Pvt Ltd.

This is a work of fiction. Names, characters, places and incidents either are products of the author's imagination or are used fictitiously. Any resemblance to actual events or locales or persons, living or dead, is entirely coincidental.

අද මගේ ජීවිතයේ වැදගත් දවසකි. එහෙත් ඒ ගැන පැවසීමට පෙර මම ඔබට කතාවක් පවසමි.

සෑම මිනිසකුට ම කතාවක් ඇත.

අප අවට ඇති විවිධාකාර වූ ගස් කොළන් සේ ද, විවිධ චරිත සහ රූපයන්ගෙන් යුත් මිනිසුන්, සතා සිවුපාවා සහ අනේකවිධ රූප රාමු මවන්නා වූ ඇළ, දොළ, ගංගා වැනි ස්වභාවධර්මයා සේ ද, අප සතුව ඇති එම කතාවත් එකිනෙකාට ආවේනික වූත් වෙනස් රසයන්ගෙන් යුක්ත වූත් කතාවක් යැයි මා විශ්වාස කරමි.

සමහරු එම කතා ලොවට ම හඬ නගා පවසමින් ඔවුන් සේ ම අනිත් අයවත් අභිප්‍රේරණය කරමින් ඒවා ලෝකයාට අනාවරණය කරද්දී, තවත් සමහරු ඔවුන්ගේ ජීවිතය පුරා ම එම කතා නිහඬව ම දරාගෙන, ඔවුන්ගේ ශරීරයන් සමඟ ම ඒවාත් පොළවේ මිහිදන් කොට රහසින් ම මෙලොවින් නික්ම යති. තවත් අය එම කතාවන්වලින් සොම්නසට හෝ දොම්නසට පත් වෙමින් ඒවායෙන් අංශු මාත්‍රයක් පමණක් ලෝකයා ඉදිරියේ හඬ නගා පවසමින් එම අතීතාවර්ජනයෙන් තවත් මිනිසුන්ව ජීවත් කරවති.

මා ඉන් කුමන වර්ගයකට අයත් දැයි මා දන්නේ නැත. හැරත් මේ කතාව පැවසූ පසුව මගේ සිතට කුමන ආකාරයේ සිතුවිල්ලක්, අස්වැසුමක් හෝ වේදනාවක් ඇති වේ දැයි ද මා දන්නේ නැත. ඒ සියල්ලට ම වඩා මෙය ලියූ පසුව මෙහි ලියවිය හැකි කරුණු කාරණා නිසාවෙන් මා මෙය මුද්‍රණය කළ යුතු දැයි මා දන්නේ නැත.

එහෙත් මේ කතාව මගේ සිතේ ඇති ලැජ්ජාව හෝ අභිමානය නිසා මගේ ජීවිතයත් සමඟ ම පොළවට වැළලී අතුරුදහන් වී ගියහොත් එයින් තවත් කෙනෙකුට ලැබෙන්නා වූ කුඩා වූ අභිප්‍රේරණයක් හෝ නොලැබෙන නිසාවෙන්, මා මෙය ලියා අවසන් කළ පසුව මේ කතාව කිසියම් වූ මුද්‍රිත මාධ්‍යයක පළ වේ නම් මම සතුටු වෙමි. තවත් කෙනෙකුගේ ජීවිතයකට කුඩා වූ ප්‍රතිලාභයක් නොවී වැළැලී ගිය ජීවිත කතාවලින් ඇති ඵලය

කුමක්ද?

ඒ නිසාවෙන් ඒ සියල්ල ම ලියා තැබීමට මම උත්සාහ කරමි.

මෙය මට ම ආවේණික එකක් යැයි මා පැවසුව ද මේ කතාවට සමාන වූ තවත් කතා ඇති මිනිසුන්ව ඔබට අනේකවත් මුණ ගැසෙනු ඇත. දිනෙක ඔවුන්ගේ කතාවත් මේ කතාවට සමාන බැව් ඔබට දැන ගැනීමට හැකි වුවහොත් **"ඔවුන් හුදකලා නොමැති බවත්, ඔවුන් සේ ම තවත් අය ජීවත් වූ බවත්"** ඔවුන්ට අනිවාර්යයෙන් ම පවසන්න. නැතහොත් මෙවන් කතා උරුම ඔවුන්ට පමණක් බැව් ඔවුන් වරදවා වටහා ගනු ඇත. මා එසේ පවසන්නේ **"මා හුදෙකලා බවත්, මා විඳි මේ වේදනාවන් තවකෙක් කිසිදා නොවින්දේ යැයි"** මා ද සිතා සිටි බැවිනි.

තරුණ කාලයේ නැතත් මා ගෙවූ ළමා කාලයේ දී මම එසේ සිතුවෙමි. ඒ නිසා ම මේ කතාවට සමාන කතාවක් ඇති කුඩා දරුවකු හෝ එසේ සිතනවාට මා කැමති නැත.

මා මෙන් ම ඔවුන් ද හුදෙකලා නැත.

"හඳට ගල් ගැසූ කොල්ලෙක්" මම මෙලෙස ආරම්භ කරමි.

මුතුමුදලිගේ නිශ්ශංක

හදට ගල් ගැහූ කොල්ලෙක්

"BEST-SELLING AUTHOR OF THRITHWA SERIES"

මුතුබුදුලිගේ නිශ්ශංක

පිදුම

”ලහිරු මැරුනා පුතේ,
යහළුවන් එක්ක නාන්න ගිහින්
එයා වතුරට යට වෙලා යන්න ගියා”

මගේ හොඳම මිතුරා වූ
ලහිරුට...

මා ඉපදුනේ විවිධ වර්ගයේ මිනිසුන් බහුල ව ජීවත් වූ ඉතාමත් ජනාකීර්ණ ප්‍රදේශයක ය. කොළඹ නගරයේ ඇති කුඩා පළාතක් වූ "මහවත්ත" නමින් හැඳින් වූ එම පෙදෙස සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනයා එකා ලෙස වාසය කළා වූත්, ගස් වැල් අල්ප, මඩ වගුරුවලින් බහුල වූ කොන්ක්‍රීට් වනාන්තරයකි. එම කොන්ක්‍රීට් වනාන්තරයෙහි මහවත්ත ප්‍රධාන බස් නැවතුමට මුහුණ ලා වූ මාර්ගය අසල ම ඇති කුඩා ලෑලි නිවෙසක මම උප්පත්තිය ලැබුවෙමි.

මගේ තාත්තා රසාලිංගම් සෙල්ලදොරෙයි නම් වූ දෙමළ තැනැත්තෙකි. අම්මා නජීමා අලී හුම්මා නම් වූ මුස්ලිම් කාන්තාවකි. ඔවුන් දෙදෙනාගේ එක ම පුත්‍රයා ලෙස උප්පත්තිය ලැබූ මා හට ඔවුන් තැබුයේ තනි සිංහල නමකි.

"පසිඳු සඳරුවන්"

ඒ මගේ උප්පැන්න සහතිකයේ මේ මොහොතෙත් ඇති - මුස්ලිම් මවකට සහ දෙමළ තාත්තකුට දාව ඉපදුණු සිංහල පුත්‍රයකුගේ නම යි.

මගේ තාත්තා වසවර්තියෙකි; මැරයෙකි; කාලයක් මට්ටක්කුළියේ කුඩු ජාවාරමට සම්බන්ධ ව නීතියේ අත් අඩංගුවට පවා පත් වූ කෙනෙකි. එහෙත් මගේ ආච්චි මෙන් ම සිංහල කමට අපූරු ලෙංගතුකමක් පෙන්නූ ඔහු කුඩා කල සිට මා හට ඉගැන්නුවේ ද සිංහල බස යි. නිවස තුළ දී පවා දෙමළ හෝ ඉස්ලාම් භාෂාව කතා කිරීම මා හට තහනම් වූ අතර මාගේ මිත්‍රයන්ගෙන් බහුතරයක් සිංහල අය විය යුතු බවට ද තර්ජනය කළ අවස්ථා අනන්තවත් විය. කොටින් ම අප නිවසේ ද දෙමළ හෝ මුස්ලිම් ආගමට අයත් පින්තූර තිබුණේ නැත. කුඩා ලෑලි පැල්පතක් වූ එහි මුදුන් උළුවස්සට පහතින් සීවලී හාමුදුරුවන්ගේ පින්තූරය තබා තිබුණු අතර තාත්තාගේ අණ විධානය පරිදි මුස්ලිම් ජාතික කාන්තාවක්

වූ මගේ අම්මා එම සීවලී පිළිරුවට දවසට තුන් වරක් දාන මාන කළ යුතු වූවා ය. කොටින් ම මහවත්තට ආසන්න ව දෙමළ සහ මුස්ලිම් පාසැල් ද බහුලව තිබුණත් තාත්තා මාව ඇතුළු කළේ මහවත්තේ තිබුණු එක ම පන්සල වූ බෝධිරාජ විහාරයේ ම රජයේ පාසැලකට ය.

මා ඉපදුණු පසුව තාත්තා මට පණ මෙන් ආදරේ කළ බැව් මා අසා ඇත. අම්මත්, ආච්චිත් ඒ ගැන අනේක කතා මා හට ගෙනහැර පෑවෝ ය. එහෙත් ඔහුගේ ඒ ආදරයත්, කරුණාවත් මා හට වයස අවුරුදු තුන සම්පූර්ණ වී අකුරු කියවීමට පටන් ගත් දා පටන් ක්‍රමයෙන් වෙනස් වන්නට විය. ඒ මගේ රූපයේ හෝ ගති ගුණවල ඇති වූ අඩුලුහුඩු කම් නිසා නොව, මගේ උගුරේ, මනසේ හෝ මුඛයෙහි ඇති වූ ආබාධයක් නිසා ය.

මේ ආබාධය පැන නගින්නේ උගුරෙන්, මුඛයෙන් හෝ මනසෙන් මේ කොහෙන් දැයි මා සැබැවින් ම දන්නේ නැත. එහෙත් මේ ආබාධය නිසා තාත්තාගේ ආදරය සහ මා කෙරෙහි තිබුණු කැමැත්තත් ක්‍රමයෙන් වෙනස් වූ බැව් පමණක් අවධාරණයෙන් පවසා මම මේ කතාවේ අතීතාවර්ජනයට යමි.

01

වසර පහළොවකට පෙර

අට වසර සමාජ අධ්‍යයනය පොතේ ඇති ලෝක සිතියම දෙස බලා සිටි මට මේ ලෝකය ගැන පුදුම සිතෙයි. එය ඒ තරම් සුවිසල් ය. උඩින් ම සිතියමෙන් බාගයක් ම පිරී ඉතිරී ඇත්තේ රුසියානු මහද්වීපයෙනි. එයින් පසුව කසකස්ථානය, උස්බෙකිස්ථානය, තජිකිස්ථානයත් එතැනින් පහත ඉන්දියාවත් පසුකර කුඩා තිතක් තරම් වූ ශ්‍රී ලංකාවත් දෙස බැලූ විට මගේ සිත කුහුලින් පිරී ගියේ අපි ජීවත් වෙන්නේ මේ තරම් කුඩා රටක දැයි සිතෙන්නට වූ නිසා ය. හැරත් එම කුඩා තිතෙනුත් අංශු මාත්‍රයක් පමණ වූ කොළඹ නගරයත්, එම අංශුවෙනුත් ඉතාමත් ම කුඩා කොටසක මා ජීවත් වූ මහවත්ත ප්‍රදේශයත් පිහිටා තිබෙනවාක් නොවෙ ද? එයිනුත් කුඩා දශමයකටත් වඩා අඩුව ඇති බිලූමැන්ඩල් කුණු කන්ද අසල දුප්පත් පැල්පතක මා ඉපදීම කුමන අරුමයක් ද? මම සිතන්නට වීමි.

ලොව කොතරම් ගුප්ත ද?

අපි කොතරම් ගුප්ත ද?

සුවිසාල ගංගාවක ඇති අඳුරු ආගාධයක, අනිකුත් මත්ස්‍යයින් අප්‍රිය කරන, කිසිවකුත් ජීවත් වීමට වත් ප්‍රිය නොකරන, අද්භූත පාසියක් උඩ පිපිරී ගිය බිත්තරයක් ද, එයින් එලියට ආ කුඩා මාළු පැටවෙක් ද, මගේ දෑස් මත මැවෙන්නට විය. මේ තරම් සුවිශාල ගංගාවක අඳුරු ආගාධයෙහි ඉපදුණු ඒ මාළු පැටවා එතැන ඉපදෙන්නට හේතුව කුමක්ද?

"උඹේ කරුමය, උඹේ විතරක් නෙමේ උඹේ අම්මගෙත් කරුමෙ, තාත්තගෙත් කරුමෙ"

මුස්ලිම් ගැහැනියක් වූ මගේ ආච්චි පංසලේ හාමුදුරුවන් මෙන්

බැරෑරුම් හැඟීමකින් "කරුම" පදය නිරන්තරයෙන් ම මුමුනන ආකාරය මට සිහි විය. මම දැස් ඔසවා මා ඉදිරියේ නිදාගෙන සිටින ආච්චි දෙස බැලුවෙමි. වෙලාව උදෑසන හයත් පසුකර ඇතත් ඇය තවමත් නිදාගෙන සිටියි. තාත්තා නිවසින් පිටව යන තුරු ම ඈ එලෙස නිදාගෙන සිටින බැව් මම දනිමි. ඈ නිදාගෙන සිටින්නේ උදෑසන ම අවදිවීමට ඇති කම්මැලිකම නිසා නොව, අවදි වූ පසුව තාත්තාගේ මුහුණ දැකීමට ඇති අකමැත්ත නිසා ය.

ඒ ගැන හිතද්දි මට ආච්චි ගැනත් පුදුම සිතෙයි.

ආච්චි කර ඇත්තේ ද කරුමයක් නොවේ ද?

තාත්තාගේ මුහුණට වහන් වී ඔහු නිවසින් පිටව යන තුරු ම දිනපතා ම හොර නින්දකින් පීඩා විඳින ඇය කර ඇත්තේ කොයි තරම් ලොකු කරුමයක් ද?

මම අම්මා දෙස බැලුවෙමි. ආච්චි නිදා සිටි ලෑලි ඇඳට නුදුරින් කුස්සියේ උළුවස්සත්, එතැනින් මදක් එහායින් ගිනි දලු නංවමින් දැවෙන ගල් තුනේ ලිපත් ඇත. එතැන ම පැඳුරක් එළාගෙන අම්මා ඉදිආප්ප තම්බයි. ඇය මේ ඉදිආප්ප පිසින්නේ පාන්දර පහේ සිට ය. ලිපේ ගිනියම් රස්නයට පිච්චෙමින්, අත්වල කරගැට එනතුරු ඉදිආප්ප වංගෙඩිය මිරිකන මගේ අම්මා ගැන මට ඇත්තේ වේදනාවකි. දහඩිය වගුරුවමින් ලිප් බොක්කට ම සින්න වී යන මගේ අම්මාගේ ජීවිතය ගැන කනගාටුවකි. ඒ අතින් ඇයත් කර ඇත්තේ කරුමයකි.

එතකොට.....

එතකොට අපි සේරම කරුමක්කාරයො නේද?

මිනිස්සු දුප්පත් වී ඉපදෙන්නේ කරුමය නිසා නම්... නිරන්තරයෙන් ම කුණු ගඳ හමන, විශාල පර්වතයක් තරම් වූ කුණු කන්දක් යට ඉපදී, මේ තරම් දුගී ජීවිතයක් ගත කරන මමත්, අම්මාත්, ආච්චිත් කොයිතරම් නම් කරුමක්කාර ද?

මම ක්‍රමයෙන් ගැඹුරු කල්පනාවක කිමිදී ගියෙමි. මම සිතුවිලි තුළින් දුටු ගැඹුරු මුහුදේ ඉපදුණු අවාසනාවන්ත මාළුවා මෙන් මම ද ආච්චි නිරන්තරයෙන් ම කියාපාන "කර්මය" ගැනත්, අම්මා සහ අපේ ජීවිතය ගැනත් සිතන්නට වූවෙමි.

"උඹ පොත කියවනව ද කල්පනා කරනව ද?"

එක්වර ම මට ඇසුණු එම ගොරහැඩි කටහඬින් මම තිගැස්සී ගියෙමි.

ඒ තාත්තා ය.

✳✳✳

තාත්තා නිවසින් පිටව යාමට පෙර අම්මාගේ සල්ලි බෝතලයට අත දමා එහි ඇති රුපියලේ කාසියක් හූරාගන්නේ කිසිම සිත් පිත් නැති අමනුස්සයෙක් ආකාරයට ය. අදත් ඔහු එන්නේ ඒ කෙරුවාවට යි. මම අම්මා දෙස බැලුවෙමි. තාත්තාගේ කටහඬ ඇසුණු විගස ම මටත් වඩා තිගැස්සී ගියේ අම්මා ය. තවත් සුළු මොහොතකින් ම තාත්තා මාවත් පසු කොට ගෙන අම්මා අසලට යනු ඇත. මම පොතට මුහුණ නැඹුරු කොටගෙන නිහඬව සිටියෙමි.

"කෝ රුපියල් පනහක් දියන්"

අම්මා ළඟට ගිය තාත්තා ඉදිආප්ප වට්ටියේ තිබුණු ඉදිආප්පමක් ද කටේ දමාගෙන අම්මාට අත පෑවේ ය.

"කොහේ තියෙන සල්ලියක් ද, තවම කඩයප්පං ගන්න කවුරුවත් ආවේ නැහැ; තියෙන්නෙ ම රුපියල් විස්සයි" අම්මා මැසිවිලි නගන්නට විය.

තාත්තා එය මායිම් කළේ නැත. අම්මා අසල තිබුණු ටිං බෙලෙක්කය අතට ගත් ඔහු එහි තිබුණු රුපියල් විස්සෙ කොලය ගෙන දෙකට, තුනට නවා එය කමිස සාක්කුවේ දාගත්තේ ය.

"වගතුවක් නැත්නම් මොකටද තම්බන්නෙ"

ටින් බෙලෙක්කයෙන් අම්මාට දමා ගැසූ තාත්තා යමින් ගමන් ආච්චිගේ නිදා සිටි ඇඳ දෙස බැලුවේ ඕනෑවට එපාවට ය.

"මෙහෙම නිදාගෙන හිටිය ම වගතුවක් තියේයැ"

ආච්චිටත් දෙස් තියමින් තාත්තා මා පසුකර යන්නට විය. මා අසල ද ඔහු නැවතුණේ ය. "උඹ ගොත ගැහුවට කමක් නැහැ,

අර ගරාජ් එකේ කොල්ලො ඉස්සරහ පීචන් වෙන්න එහෙම එපා"

තාත්තා ගරාජ් එකේ කොල්ලා යයි කියන්නට ඇත්තේ රනිදුට ය. ඔහු පාර අයිනේ ඇති ත්‍රීවීල් ගරාජ් එකේ වැඩ කරන මදාවියෙකි. මා එතැනින් යද්දි "ගොතයා" යි මුමුනමින් විසිල් ගැසීම ඔහුට සතුටකි. තාත්තා මගෙන් පිළිතුරක් ලැබෙන තුරු එතැන නැවතී සිටී මුත් මා කිසිවක් නොකියා පොතට මුහුණ ඔබාගෙන සිටි නිසාවෙන් මොනවදෝ දොඩවමින් ඔහු එතැනින් යන්නට ගියේ ය.

✳✳✳

තාත්තා කුස්සියෙන් පිටව ගිය පසුව ආච්චි දඩි බිඩි ගා ඇඳෙන් නැගිට ගත්තා ය. ඇතින්නිය මෙන් ඇඳෙන් හිටගත් ඈ දෑත ම එකට එකතුකර ඇනුමක් ඇරියේ ඇතින්නිය හොඬවැල ඔසවා කුංච නාද කරන්නාක් මෙනි. එය දැකීමෙන් මගේ මුවට ආයේ සිනහවකි.

"උඹ ඇයි හිනාවෙන්නෙ" ඇය මා දෙස බලා ඇසුවා ය.

"ම..ම....ම.... හිනා"

"ඇති ඇති නවත්තපන්" ආච්චි මගේ කැඩුණු වචන හරඹය එතැන ම නවත්තා දැමුවා ය. ඇඳ මත වැටී තිබුණු හවරියත් අතට ගෙන එය කොණ්ඩයේ බැඳගත් ඇය කටවත් නොසෝදා ගොස් අම්මා අසල වූ හිරමනය උඩින් වාඩි වූවා ය.

"අදත් අර වසවර්තියා සල්ලි ගත්තනේ"

අම්මා කිසිවක් කීවේ නැත. ආච්චි නිදාගෙන මෙන් සිට තාත්තා නිවසින් ගිය පසුව අම්මා අසලට විත් අසන පළමු පැනය එය වූ බැවින් අම්මා නිරන්තරයෙන් ම එයට පිළිතුරු දීම මග හැරියා ය.

"මට ඇහුණ මටත් මොනවදෝ කියාගෙන යනවා... ලැජ්ජා නැති එකා මගේ ගෙදර ඉඳන් මට ම දෙස් තියනවා" ආච්චි ඇතිළියේ තිබුණු තැම්බුණු පිටි ලොට්ටය අනන්නට පටන් ගත්තා ය.

"කෝ තාම කවුරුත් ආවේ නැද්ද?

"නැහැ. සෙල්ලම්මලගේ ගෙදරින් නම් විස්සක ඉල්ලුවා"

"ඒ විස්ස වෙන්න ඇති අර මදාවිය අරගෙන යන්න ඇත්තේ"

"හ්ම්" අම්මා මිමිණුවා ය.

"උඹට මම හැමදාම කියනව ඔය ටින් එක හංග ගනින් කියල.. කොහේද... උඹත් මිනිහට පුදන්න ආසාවට පේන්න තියාගෙන ඉන්නවා"

"ආසාවට නෙමේ අම්මෙ. ඕක කොහේ කියලා හංගන්න ද? අනික මම සල්ලි දුන්නැත්නම් ඔය මිනිහ මෙතැන ම ඉඳගෙන කාගෙන් හරි කීයක් හරි එනකන් බලාගෙන ඉන්නවා"

"හෙනහුරා" ආච්චි කීවා ය. මම ඈ දෙස බලා සිටියෙමි. ඇයට ඇත්තේ කළු සමකි; මහත සිරුරකි. වත්තේ සිටි අනිකුත් මුස්ලිම් කාන්තාවන් මෙන් ම ඇයත් හිස වැසෙන්නට කළු සළුවක් පැලඳ සිටියි. එහෙත් අම්මා ඊට හාත්පසින් ම වෙනස් ය. හීනි දිගැටි මුහුණකුත්, කෙසඟ සිරුරකිනුත් යුක්ත වූ ඈ, දර ලිප ඉදිරියේ හිඳගෙන සිටියේ දෙකට තුනට නැමී රෝගියකු මෙනි.

"කෝ ඕක මටත් ඇහෙන්න හයියෙන් කියවපන්" මා අම්මා දෙස බලා සිටිනු දුටු ආච්චි ප්‍රශ්න කරන්නට විය.

"මොා..මොා..නව ද?"

"මොනව ද? උඹ ඔය කියවන එක තමා."

"ඒ.....ඇ...යි" මම එක දිගට වචන උච්චාරණය කරන්නට උත්සහ කළෙමි. එහෙත් වචන එන්නේ කැඩි කැඩී ය.

"ඒ ඇයි කියන්නේ, හයියෙන් කියෙව්ව ම තමයි ගොතය හොඳ වෙන්නේ, මට ඇහෙන්න හයියෙන් කියවන්න බැරි නම් අර වෙල දිහාටවත් ගිහින් කට ඇරලා හයියෙන් කියවපන්" ආච්චි කුස්සියට එහා පසින් පෙනෙන වෙල දෙසට අත දිගු කර කීවා ය.

වේලාව උදෑසන හතට ආසන්න ව ඇති හෙයින් හිරු එළිය හොඳින් පොළෝ තලයට පතිත වෙමින් ඇත. එම හිරු එළියෙ ම නැහැවෙමින් කුස්සියට එහා පසින් ඇති වෙල් යාය කුඹුරු යායක් මෙන් කොළ පැහැයෙන් පෙනෙයි. එයටත් එහා පසින් ඇත්තේ බිලූමැන්ඩල් කුණු කන්ද ය. උදෑසන සුළඟත් සමඟ එම කුණු

කන්ද දෙසින් හමා එන්නේ දුර්ගන්ධයකි. එහෙත් කුණු කන්දේ දුර්ගන්ධය නාසයට හොඳින් පුරුදු අපිට එය තවත් දුර්ගන්ධයක් නොවෙයි.

"ම...ම හෙට...ඉඳ..න් කියවන්නම්" මම ආච්චිට කීවෙමි.

"හැමදාම හෙට හෙට ගාන්න එපා.. හෙට ආච්චි මැරුනොත් උඹට මේව කියලා දෙන්න කෙනෙක් නැති වෙනවා" යි කී ආච්චි වචනයක් හංගාගෙන "කරුමේ කරුමේ" යැයි දෙවරක් මුමුනා අම්මා ලිපේ තබා තිබුණු ඉදිආප්ප භාජනයේ පියන විවර කළෙන් එයින් ආ සුවඳින් මගේ නාසය පිරී යන්නට විය. පොත පැත්තකින් තැබූ මම ආච්චි අසලට ගොස් හිට ගත්තෙමි. ආච්චි ඉදිආප්පම් භාජනය ලිපෙන් බා වට්ටියෙන් එලියට ගත් ඉදිආප්පමක් මගේ අතේ තැබුවා ය.

"අහා, ඕක හපන්නැතිව එක පාර ම ගිලපන්... රස්නෙට කන එක උගුරට හොඳයි"

මම ඉදිආප්ප ම අතට ගෙන එයින් කැල්ලක් කඩා ආච්චි කියූ ආකාරයට ම එය ගිල දැමුවෙමි. එහි රස්නයට මගේ උගුර පිච්චී යන්නට විය. එයින් ආ වේදනාව කරණ කොට ගෙන මම උගුර අල්ලා ගත්තෙමි. අම්මා ද එය දකින්නට ඇත.

"උඹත් මෝඩය වගේ ආච්චි කියන හැමදේම කරන්න යනව ද? වතුර එකක් බීපන්" අම්මා මට සැර දැම්මා ය. මම අතේ තිබුණු අනෙත් ඉදිආප්පම් කැබැල්ලත් කටට ඔබාගෙන හිඳගෙන සිටි තැනට ම යන්නට වීමි.

"ගොත ගැහුණට කමක් නැහැ. ඌ අඩු ම තරමින් කතා කරනවනේ. අම්මට කොල්ලගෙ ගොතය පේන්න බැරි නම් ඌට ඌගේ පාඩුවේවත් ඉන්න දෙන්න, විකාර කියවන් නැතිව" අම්මා ආච්චිට ද බැන වදින්නට විය. මම පොතත් අතට ගෙන යළිත් පුටුවේ හිඳ ගත්තෙමි.

"ගොත ගැහුණට කමක් නැහැ කියන්නෙ බං... ඇයි ඌ ඒක සනීප කරගන්න එපා ද?"

"සනීප වුණේ නැත්නම් ඒකත් ඕනෙ නැහැ... හැමදාම ගොතයක් ගැන කියවන්න එපා"

"හ්ම්. එහෙනම් ඉතින් ඕන දෙයක් කරගනින්කෝ" ආච්චි කරබා ගත්තා ය. මම අම්මා දෙස බැලුවෙමි. අම්මා ද මා දෙස බලන්නට විය. අප දෙදෙනාගෙ ම ඇස් එකිනෙකට ගැටෙන විට මගේ හදවත අම්මාගේ ඇස්වල වූ දයාවෙන් මිරිකී ගියේය. ලිපේ රස්නයත් සමඟ පොරබදා ම එම දෑස් රතු පැහැති ය. ඒවායේ ඇත්තේ වෙහෙසකර බවකි; අසරණ දරිද්‍ර බවකි; කළු ගැසුණු ඇස් කෙවෙනි කඳුළෙන් පිරී යමින් ඇත. ඒ කඳුළු උනන්නේ ලිපේ රස්නෙට ද එසේත් නැතහොත් ආච්චි මගේ ගොතය ගැන කියන්නට වූ නිසා දැයි මම නොදනිමි. මා යළිත් පොතට ඇස් යැව්වේ තවත් අම්මා දෙස බලා සිටීමට තරම් මගේ හිතට ශක්තියක් නොවූ බැවිනි.

මට යළිත් ගැඹුරු මුහුදේ සිටි මාළු පැටවාව සිහියට ආවේ ය. ඌ කුඩා ය; අඳුරු ආගාධයේ සිරවී ඇත. ඌට ඉහළින් යාන්තමින්වත් ආලෝකයක් පෙනෙන්නේ නැත.

✳✳✳

මගේ පාසැල මහවත්ත තිබුණු එක ම පන්සල වූ ශ්‍රී බෝධිරාජ විහාරය අසල ම තිබුණු බෝධිරාජ විදුහල යි. උදේට පාසැලට යද්දි බෝධිරාජ විහාරයේ ලවුඩ්ස්පීකරෙන් පිරිත් දමා ඇති හෙයින් මාර්ගයේ හිමින් සීරුවේ ගමන් කරන අතර එම පිරිත් බණවලට ඇහුන්කන් දීම මගේ සිරිත යි. කරේ තිබුණු බෑගය ද පිටට තද කරගත් මා ලවුඩ්ස්පීකරෙන් ඇහෙන පිරිත්වලට ඇහුම් කන් දුන්නේ නිහඬ මනසකිනි.

පිංවතුනි, අප භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩවසන සමයෙහි එක්තරා දේවතාවුන් වහන්සේ කෙනකු විත් උන්වහන්සේගෙන් මෙසේ අසනවා :

අන්තෝ ජටා බහි ජටා

ජටාය ජටිතා පජා

තං තං ගොතම පුච්ඡාමි

කො ඉමං විජටයෙ ජටං

හාමුදුරුවන් වහන්සේ ගාථාව සුමියුරුව ගායනා කරයි.

"ඇතුළත් අවුල් පිටතත් අවුල් මුළු සත්ව ප්‍රජාව ම අවුලෙන් අවුල්ව සිටිති. ගෞතම සර්වඥයන් වහන්ස, මේ අවුල නිරවුල් කරන්නේ කවුදැ යි ඔබ වහන්සේගෙන් අසමි."

මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයන බුදුරජාණන් වහන්සේ " දේවතාවෙනි, සීලයෙහි පිහිටි නැණවත් මිනිසා සමාධිය හා විදර්ශනාව වඩන්නේ, උත්සාහයෙන් ප්‍රඥාවෙන් යුක්ත වූයේ මේ අවුල් නිරවුල් කරන්නේ ය" යි වදාළ සේක.

මම නැවතුනෙමි. මට හාමුදුරුවන් විසින් දේශනා කළ තේරුම් පදය ස්ථීර සාරව ම තේරුම් ගත නොහැක. එහෙත් උන්වහන්සේ කියූ "උත්සාහයෙන් සහ ප්‍රඥාවෙන් යුක්ත පුද්ගලයා ගැටළුව නිරවුල් කරගන්නේ ය" යන කියමන මගේ සිතට තදින් වැදුණේ ය. මගේ පංතියේ සිංහල උගන්වන ගුණසේකර ගුරු මැණියන් ද නිරන්තරයෙන් ම පවසන්නේ මෙය යි. පංතියේ සිංහල ඉගෙන ගැනීමට අපොහොසත් ළමුන්ව ගෙන්වා "උත්සාහයෙන් කළොත් ඔය දරුවන්ටත් පුළුවන්" යැයි ඇය නිරන්තරයෙන් ම අවවාද කරයි. මගේ ආච්චි පවසන දේවල් ගැන මා උනන්දු නොවෙතත් ඇයත් පවසන්නේ මේ ආකාරයේ ම දේවල් යැයි මට සිතෙයි.

"වෙලට ගොස් හඬ නගා පාඩම් කිරීම"

"උගුරේ දෝස යන්න උණු ඉදිආප්පම් කෑම"

මේ සියල්ලෙන් ම අදහස් වන්නේ දෝෂයක් නිවාරණය කර ගනු වස් යමක් සිදු කිරීම යි. දවසක් මගේ පංතියේ සුනිමල් ද පැවසුවේ මේ ආකාරයේ ම දෙයකි. මගේ වචන පටළැවිල්ල ගැන පංතියේ අනිත් ළමෝ මට නිරන්තරයෙන්ම විහිළු තහළු කරද්දී සුනිමල් පමණක් එය නිරාකරණය කර ගැනීමේ ක්‍රමයක් ගැන මට කියා දුන්නේ ය.

"උගුරේ වයර් ෂෝට් එකක්" ඔහු කීවේ ය.

ඔහුගේ පියා හෙට්ටියාවත්තේ ගරාජයක හිමිකරුවෙක් වූ බැවින්, හය වසරේ ඉගෙන ගත්තත් සුනිමල් ද රථ වාහන යහමින් අතපත ගා ඇති කෙනෙකි. ඔහු මාව පංතියේ කළු ලෑල්ල ළඟට ගෙන ගොස් එහි මිනිස් උගුරේ චිත්‍රයක් ද අඳිමින් ඔහු දන්නා දේ

මනාව පැහැදිලි කර දුන්නේ ය.

"මේ උගුරේ තියෙන නහරවල්." ඔහු උගුරේ ඉරි කඩ කිහිපයක් අඳියි. "හරියට වාහනයක එන්ජිමට හයිකරල තියෙන වයර් වගේ තමා, මේ නහරවල් හයිවෙලා තියෙන්නේ හදවතට යි; ඔළුවට යි. ඔයා කතා කරන්නේ මේ නහරවල්වලින්. මෙන්න මෙතැන" ඔහු මගේ උගුරෙහි කුඩා තැනක හුණු කැබැල්ලෙන් රවුමක් අඳියි.

"මෙන්න මෙතැන ෂෝට් එකක්. නහරයක් කැඩිලා, ගැලවිලා, එහෙම නැත්නම් හිරවෙලා"

"ඉ....තින්....මම්ම... මොනවද කරන්නේ"

"ඔයාට කරන්න දෙයක් නැහැ... ඩොක්ටර් කෙනෙක්ට කියලා පාස්සන්න වෙනවා... තාත්තා වාහනවල වයර් පැස්සුවට නහරවල් පාස්සන්නෙ ඩොක්ටර්ස්ලා"

ඔහු කීවේ ස්ථිරව ය. මම ඔහුට ස්තුති කලෙමී. අඩු ම තරමින් පංතියේ එක ම එක මිතුරෙක් හෝ මගේ ගොත ගැසීමට හේතුව සොයා ගෙන ඇත. මම එදින සවස නිවසට ගිය පසුව සුනිමල් කියූ දේ මගේ අම්මාට කීවේමි. එහෙත් අම්මා එය අසා මට සැර වූයේ "පණ්ඩිතකම් කතා නොකර ඉඳපන්" කියමිනි. "උඹේ උගුරේ මුකුත් නැහැ. උඹ හරියට කතා නොකරන්නෙ උඹට වුවමනාවක් නැති නිසයි; කට ඇරලා හොඳට කතා කළොත් ඕක නැති වෙලා යයි." ඇය මට කීවේ සුනිමල්ගේ අදහස ඉවතට විසි කර දමමින් ය.

✳✳✳

මම පාසලේ ගේට්ටුව අසලට එත් ම පාසැල ආරම්භ කිරීමේ සීනුව නාද කළෙන් බෑගය අතට ගත් මම පාසැල තුළට දිව යන්නට වීමි. සීනුව ගසද්දී සියලුම ළමුන් පාසැල් පිට්ටනියට පැමිණිය යුතු ය. පිට්ටනියේ තැන් කිහිපයක පංතිවලට අනුව ආගම සිහිකිරීම ආරම්භ වෙයි. මම දිව ගොස් අට වසරේ සිසුන් හිටගෙන සිටිනා කාර්යාල කාමරය ඉදිරියේ ඇති වැලි තීරුවට ගොස් හිටගත්තෙමි. පංතියේ කොලුවන් එකා දෙන්නා එතැනට විත් පෝලිම සෑදෙන්නට විය. පෝලිම ඉදිරියේ ම ඇති කොරිඩෝව

මත හිටගෙන සිටියේ මගේ පංති භාර ගුරුතුමිය වන රූපසිංහ ගුරුතුමිය යි.

රවුම් මුහුණකින් ද, පැහැපත් සමකින් ද යුක්ත වූ ඈ අනිත් සියලුම ගුරුවරියන්ට වඩා සිරියාවන්ත ය. ඇයගේ මුහුණේ මා අනිත් ගුරුවරියන්ගෙන් නොදුටු කරුණාවක් ගැබ්ව තිබෙයි. එහෙත් ඈ කුමක් හෝ හේතුවක් නිසාවෙන් මා සමඟ කතා කිරීමට ප්‍රිය නොකළැයි මම සිතමි. මම කුණු කන්දක් අසල ජීවත් වන නිසා මගේ ඇඳුම්වලින් නිරන්තරයෙන් ම කුණු ගඳ වහනය වේ යැයි අනිකුත් කොල්ලන් මැසිවිලි නගන්නෙන්, ඇය මා සමඟ කතා නොකරන්නේ ද ඒ හේතුව නිසා යැයි මම සිතුවෙමි. හැරත්, මගේ පංති භාර ගුරුතුමිය ඈ වුව ද ඇය උගන්වන්නේ ඉංග්‍රීසි විෂය බැවින් පංතියේ බොහෝමයක් කොල්ලන් මෙන් මමත් එයට අසමර්ථයෙකි. ඈ මා සමඟ වැඩි කතාවක් නොකිරීමට එයත් හේතුවක් යැයි මම සිතමි.

බෑගයත් බිමින් තැබූ මම පෝලිමේ කොනේ ම හිටගෙන සංසුන්ව බලා සිටියෙමි. ඇය පෝලිමේ සිටින කොල්ලන්ගෙන් එකෙකුව ඉදිරියට ගෙන්වා ඔහුට තුණුරුවන් කියන්නැ යි අණ කරයි. ඒ කොල්ලා කිසිදිනෙක මා නොවූයෙන් මගේ සිතට චකිතයක් හෝ බියක් ඇති වූයේ නැත. එහෙත් ඈ දෙස එලෙස බැලීමට බිය වූ කොල්ලන් "ඇය ආගම කීමට අඬ ගසයි" බියෙන් බිම බලාගෙන ඇයගේ ඇස්වලට හසු නොවී සිටීමට වෑයම් කරයි.

"කෝ ඔක්කෝමල්ලා ආව ද?" ඇය උස් හඬින් ඇසූයෙන් පංතියේ මොනිටර් පෝලිම මැදට විත් ළමුන් ගණන් කරන්නට පටන් ගත්තේ ය.

"විසි නවයක් ඉන්නවා ටීච" ඔහු කීවේ ය.

"හරි..එහෙනම් ආගම කියන්න පටන් ගමු" ගුරුතුමිය යළිත් පෝලිම සිසාරා බැල්මක් හෙලන්නට විය. මට ගොත ගැසීමක් ඇත. එය ගුරුතුමියත් දන්නා නිසාවෙන් ඇය මාව කොරිඩෝවට අඬ නොගසනු ඇත. මා සිතුවෙමි. එහෙත් පෝලිම සිසාරා ගිය ඇයගේ දෑස් එක්වර ම මා ඉදිරියෙන් නතර වූයෙන් මම තුෂ්ණිම්භූත ව ගියෙමි.

"පසිඳු... එන්න ගාථා කියන්න" ඇය මට කතා කළා ය.

මගේ මුළු ශරීරය ම සීතල වී යන්නට විය. ගැඹුරු ආගාධයෙහි හිරවුණු මාළු පැටවා අනතුරක් දැක වරල් ගසමින් තවත් ගැඹුරට ම පලා යන්නාක් මෙන් මමත් සපත්තු දෙකෙන් පොළව පහුරු ගසමින් චකිතයෙන් වෙවුලන්නට පටන් ගතිමි.

"ටී...ච්..ච...මම" හදිසි කම්පනයක දී සිදුවන්නාක් මෙන් මගේ කට තවත් ගොත වන්නට විය.

"ඔව්. ඔයා තමයි" මගේ තොල් එක්වර ම වේළී ගියාක් මෙන් ඒවා කටට ම සිර වන්නටත්, පාදයන් ඇණ හිටින්නත් විය.

"කෝ ඉක්මනට එනවා" ගුරුතුමිය සාරි පොටත් උරහිසට දමාගෙන කෑ ගසන්නට වූයෙන් මම අදිමදි කරමින් කොරිඩෝවට පාදය තැබුවෙමි.

මට තිබුනේ ඈ දෙස නොබලා සිටින්නට ය. අනිත් කොලුවන් සේ ම ඇයගේ ඇස්වලට මායිම් නොවී සිටියා නම් මේ විපත්තිය නැත.

එහෙත් මා දැන් එයට හසුවී ඇත. දැන් කුමක් කරන්න ද?

දෑත් මුදුන් දී කොලුවන් ඉදිරියේ හිටගත් මම බියෙන් සහ චකිතයෙන් වේළී ගිය තොල් විවර කිරීමට වෑයම් කළෙමි. එහෙත් මගේ තොල්වලින් හඬක් එන්නේ නැත. ගුරුවරිය සහ පෝලිමේ සිටිනා කොලුවන් ද හිසට අත් තබාගෙන මම ගාථා පටන් ගන්නකන් බලාගෙන සිටියි. මුලින් ම කිව යුත්තේ "නමෝ තස්ස භගවතෝ අරහතෝ" පදය යි. "න" අකුර ශබ්ද කිරීම මගේ මුඛයට කොහොමත් ම අසීරු කටයුත්තක් වූයෙන් එය මේ මොහොතේ නම් කොහෙත් ම පිට නොවනු ඇත.

"න..න්...න්....න්.....න්...." මම වෑයම් කළෙමි.

"න්....න්..." එහෙත් එම පදය මගේ මුඛයෙන් එලියට එන්නේ නැත.

පෝලිමේ ඉදිරියෙන් ම සිටින කොලුවන් ඔළුවට දැතත් බැඳගෙන මා දෙස බලමින් සිනාසෙයි.

"න්....න්...මෝ..." මම යළිත් උත්සහ කළෙමි. මගේ උගුරට වචනය පැමිණෙයි. එහෙත් ඒ මොහොතෙ ම ඉහළට ඉලිප්පී එන

කුමක් හෝ, පිටවීමට යන එම වචනය මගෙන් උදුර ගන්නාක් මෙන් වචනය කටින් පිටවීමට ඉඩ නොදෙයි. ඒ වෙනුවට එන්නේ තොල් එකට මූට්ටු වෙමින් දිව උඩ යට ගැටෙමින් නිකුත් වෙන වචනයේ ශබ්දය පමණි.

මගේ ඇස් දෙකට කඳුළු උනන්නත්, මගේ යටි බඩ මූත්‍රාවලින් පිරී යන අයුරුත් මට දැනෙන්නට වූයෙන් තවත් සුළු මොහොතකින් ම මට කලිසමේ ම චූ යාවීයි බියෙන් කකුල් දෙක එකට මූට්ටු කර ගත්තෙමි. ඒ මොහොතෙ ම මා අසල සිටගෙන සිටි රූපසිංහ ගුරු මැණියන් මහා හඬින් "නමෝ තස්ස භගවතෝ" කියන්නට විය.

එය මට ඇසෙත් ම මගේ සිතට ආයේ මහත් වූ සැනසිල්ලකි. ඇයත් සමඟ ම පෝලිමේ සිටි කොලුවන් ද ගාථාව කියවාගෙන යන්නට වූයෙන් මම ද කට විවර කළෙමි. මා බියට පත්ව චකිතයෙන් සිටි මොහොතේ මෙන් නොව ඇයත් සමඟ කියද්දී ගාථා පද නිරායාසයෙන් ම මගේ මුවින් නික්මෙන්නට වූවේ ය. මා එයින් ලද සැනසිල්ල අනන්ත අප්‍රමාණ ය. ඒ සැනසිල්ල නිසා ම උදෑසන පාසැලට එද්දී හාමුදුරුවන් වහන්සේ ගාථාව කියූ සුමධුර ආකාරය මට සිහිපත් වූයෙන් මම ද මා කියවමින් සිටි ගාථාව කවියක් ආකාරයෙන් කටින් පිට කරන්නට වීමි. මොහොතකින් රූපසිංහ මැණියන් නිහඬ වන බව මට දැනිණ. කොලුවන් ගාථා කියමින් යන මුත් ගුරුතුමිය කිසිවක් කියන්නේ නැත. එහෙත් මගේ මුවින් කවියක් ලෙස පිටවෙන ගාථා සමුදාය තවමත් ඒ ආකාරයෙන් ම නිරායාසයෙන් ම මුවෙන් පිට වෙමින් ඇත. මම දෑස හරවා ගුරුතුමිය දෙස බැලුවෙමි. නළලට දැතත් තබාගෙන ඇය මා දෙස බලාගෙන සිටියි. මා ඈ දෙස බලද්දී සිහින් සිනහවක් හෙලූ ඈ "දිගට ම කියන්නැ යි" පවසන ආකාරයට හිසින් ඉඟියක් කළෙන් මම එයින් තවත් ප්‍රබෝධයට පත් වුණෙමි.

මම ගාථා පේළි සියල්ල ම ප්‍රබෝධයෙන් ද, වෙනත් කිසිම දවසක නොකී තරම් අපූර්වත්වයෙන් ද ගායනා කළෙමි. ගාථාවන් කවියක් ආකාරයෙන් මගේ මුවින් පිට වෙද්දී මට එයින් අපහසුතාවයක් ද දැනුණේ නැත. නිරන්තරයෙන් ම කැඩී බිඳෙන "න, ක, ළ, ව, ම" වැනි අකුරු පවා මගේ මුවින් නිරායාසයෙන් පිට වෙන්නට විය. මා එයින් කොතරම් ප්‍රබෝධයට පත්වී ද යත් ගාථා සියල්ල ම කියා අවසන් වූ පසුව ඒ කියූ දෑ යළිත් මුල සිට කීමට

තරම් ප්‍රීති ප්‍රබෝධයකින් මගේ සිත පිරී ගියේ ය. අවසානයේ දී "නව නියමයක්" සොයා ගත් ආකිමිඩිස් බලවත් චිත්ත ප්‍රීතියෙන් යුක්තව පාර දිගේ "යුරේකායි" කෑ ගසමින් දිව ගියාක් මෙන් මම ද බෑගයත් එල්ලා ගෙන පංතියට දිව ගියෙමි. ජීවිතේ මුල් ම වතාවට මා ගොත ගැසීමට ප්‍රත්‍යක්ෂ බෙහෙතක් සොයා ගත්තායි මම සිතුවෙමි.

මා වචන පිට කරද්දි ඒවා කවියක ආකාරයෙන් පිට කළ යුතු ය. එවිට ඒවා පිටවන්නේ නිරායාසයෙනි. මම සිතුවෙමි.

එදින නිවසට ගිය පසුව ද මම එය අත්හදා බැලුවෙමි.

අම්මට කඩේ යන විට "අම්මේ මම එහෙනම් යනවා"යි මා තාලයට කීවෙමි. වචන සියල්ල ම එකක්වත් නොකැඩී සියුම් ව මගේ මුවින් එලියට ආවේ ය. ආච්චි ඉදිරියේ පාඩම කියවන විට මම එය පටන් ගත්තේ ගීතයක ආකාරයට තාලයට ය. පාඩමේ මුල් වචන කිහිපය නිරායාසයෙන් එලියට ආ අතර ආච්චි ඇයගේ නළලත් රැළි කොටගෙන මා දෙස බැලුවා ය.

"උඹ ඔය කවියක් ද කියවන්නේ කතාවක් ද" ඇය මගෙන් ඇසුවා ය.

"දෙක ම" කී මම සිනා නැගුවෙමි.

මා කියූ ආකාරයට ම මම ජීවිතයේ මුල් ම වතාවට ගොත ගැසීමට මාර්ගය සොයා ගත්තා යැයි සතුටු වූයේ ඒ දවසේ දී ය. එහෙත් එය වැඩි කාලයක් කරගෙන යාමට මට හැකියාවක් ලැබුණේ නැත.

✶✶✶

පහුවෙනිදා උදෑසන ගුණසේකර ගුරුතුමිය පංතියට ආවේ ඇයගේ දුවත් සමඟ ය. අප පාසැලට ම ආසන්නව තිබුණු ගැහැනු ළමෝ පමණක් ඉගෙන ගන්නා පාසැලක ඈ ඉගෙනුම ලැබුවා ය. අපිට වඩා වයසින් වැඩි කෙට්ටු උස කෙල්ලක වූ ඈගේ එක ඇසක් වපර ය. ගුරුවරිය ඇයත් සමඟ ම පංතියට විත් ඇයටත්

පංතිය ඉදිරියෙන් තිබුණු පුටුවක හිඳගන්නැයි කීවා ය.

"අද මගේ දුවට නිවාඩු, ඒ නිසා අද එයත් ඔය ළමයි එක්ක මේ පාඩමට එකතු වෙයි" කී ඇය සිංහල සාහිත්‍ය පොත අතට ගත්තා ය.

"ළමයි සේරම උදේට කාලද ඉන්නෙ" ඇය ඇසුවා ය.

"ඔව් ටීච" ළමුන් කිහිප දෙනෙක් පිළිතුරු දුන්නෙන් පසුපස පේළියේ සිටි කොලුවන් කෙල්ල දෙසත් බලමින් කවටකමට "නැහැ ටීච" යි පවසනු මට ඇසිණ.

"පුතාලා මම එහෙම ඇහැව්ව නිසා විහිළු කළාට කමක් නැහැ හැබැයි ඔය ප්‍රශ්නය මම අහපු විදියට ම ඔයාලගේ යහළුවන්ගෙ නුත් අහන්න ඕන තේරුණා ද? විහිළුවට නෙමෙයි ඇත්තටම අහන්න ඕන... දැන් ගොඩක් දරුවන් කන්නෙ බොන්නෙ නැතිව ඉස්කෝලෙට එනවා ළමයිනේ, ඊයේ උදේ ආගම සිහි කරද්දි මගේ පංතියේ දරුවෙක්වත් කලන්තෙ දාලා ඇදගෙන වැටුණා, පව්" ගුරුතුමිය කම්මුලට අත තියා ගත්තා ය.

"ඒ නිසා විහිළුවට නෙමෙයි ඔයාලගේ යහළුවන්ගෙන් ඔය ප්‍රශ්නෙ ඇත්තටම අහන්න... කොහොමද හොඳින් ඉන්නව ද කියලා අහනවට වඩා, කාලද ඉන්නේ කියල ඇහැව්වත් කමක් නැහැ"

ගුරුතුමිය යාන්තම් වූ සිනහවකුත් සමඟ පංතිය දෙස බලමින් කීවා ය.

ගුණසේකර ගුරු මැණියන් මා ඉතාමත් ප්‍රිය කරන කෙනෙකි. ඇය පිටරට කාන්තාවක් මෙන් පියකරු සමකින් ද, අපූරු සිනහවකින් ද යුක්ත ය. මදක් කොට අයකු වූ ඇයගේ මුහුණත්, ඇය පිට කරන වචනත් මහා කරුණාවන්ත බවකින් යුක්ත ය. ඇය අපට ඉගැන්නුවේ සිංහල භාෂාව යි.

"අද මගේ දුවත් ඉන්න නිසා අපි විනිවිදිමි අඳුර කියවමු" ඇය කීවා ය.

ඒත් සමඟ පංතිය පුරා ම පොතේ පිටු පෙරළන හඬත්, කොලුවන්ගේ මිමිණිල්ලත් ඇසෙන්නට විය.

"හා කවුද මුලින් ම කියවන්නෙ?" ගුරුතුමිය ඇසුවා ය.

පංතියේ පසුපස පේළියේ සිටි කොලුවන් එකා දෙන්නා සිනහ සෙන්නට විය. ඔවුන් නිසැකව ම කුමක් හෝ දේකට අර අදිනු ඇත. ගුරුතුමියගේ දුවත් පංතියේ සිටින නිසාවෙන් ඔවුන් එය හාස්‍යයකට ගනු ඇත.

"පසිඳු ටීච" එක් කොල්ලෙක් මහා හයියෙන් කෑගසා කියනු මට ඇසුණේ ය.

එය ඇසෙද්දී මුලින් ම මගේ හිතට බියක් ඇති වුවත් පසුව එය කෝපයකට පෙරළුනේ ය.

උන් සිතන්නේ මට කියවන්න බැරි ය කියා ද? මම සිතුවෙමි.

මා කියවද්දි ගොත ගැහෙන බව ඇත්ත ය. එහෙත් එය මා කළ සොයා ගැනීමෙන් පසුව මදක් යට ගොස් ඇත. මගේ සිතට ආ කෝපයත් සමඟ ම ඇති වුයේ එම සොයාගැනීම නිසා වූ ආඩම්බර කමකි. වයස අවුරුදු දහ හතරක ගොත ගැහෙන කොල්ලකු වූ මට මගේ දුර්වලතාවයට සරිලන බෙහෙතක් සොයා ගැනීම මහමෙරක් බඳු විය.

පසුපසින් "පසිඳු" යි නම ඇසෙද්දි ඉදිරිපෙළ සිටි කොලුවන් එකා දෙන්නා මගේ මුහුණ දෙස බැලූයෙන් ගුරුතුමියගේ දියණියත් මා දෙසට හැරෙනු මම දුටුවෙමි.

"මුන්ට මා කවුදැයි පෙන්විය යුතු ය.... පැහැදිලිව ගාථා කීමෙන් පසුවවත් උන් තව ම මා ගැන වටහා ගෙන නැත"

සිතට දිරිය ගත් මම පුටුවෙන් නැගිට්ටෙමි. ගුරුතුමිය පුදුමයෙන් මා දෙස බැලුවා ය.

"ඔයාට පුළුවන් ද?" ඇය මගෙන් ඇසුවා ය.

"ඔව් ටීච" මම කීවෙමි.

"ආ එහෙනම් කියවන්න... ළමයි නිශ්ශබ්ද වෙන්න" ඇය මේසය මත වූ වේවැලෙන් මේසයට තට්ටුවක් දමන ගමන් සැර කළා ය. පංතිය මීයට පිම්බාක් මෙන් නිහඬ විය. මම කවියක් කියන ආකාරයට පාඩමේ මුල් ම පරිච්ඡේදය පටන් ගත්තෙමි.

"විනිවිදිමි අඳුර.....ජී බී සේනානායක මහතා" මා එම කොටස

කියවා අහවර කරත් ම පංතියේ සිටි උන් කොක් හඬලා සිනහා සෙන්නට විය. මා පොත දැතින් ම තුරුලු කරගෙන ඔවුන් දෙස බැලුවෙමි.

"කවියක් නෙමේ ඕක කතාවක්" පිටුපසින් ඇසෙන්නට විය.

"ගෝතා, කවි ඉල්ලෙයි." දෙමළකු වූ ජිනා ඔහුගේ භාෂාව මිශ්‍ර කරමින් පරිභව කරයි.

"ටීච මෙයාට කවියක් කියන්න දෙන්න එයාට කතා කියවන්න බැහැ" තවත් එකෙක් කෑ ගසයි. මා අසල ම සිටි තරිඳු මට හිඳගන්නැ යි පවසමින් මගේ කලිසමෙන් අදියි.

ගුරුතුමිය ඒ මොහොතෙ ම පුටුවෙන් නැගිට වේවැලෙන් මේසයට කිහිප වරක් ම තට්ටු කළෙන් පන්තියේ කෑගැසූ එවුන්ගේ කටවල් ටිකෙන් ටික වැසී ගියේ ය.

"පසිඳු කියාගෙන යන්න" ගුරුවරිය මට අණ කළා ය. මම යළි පටන් ගන්නට වීමි. කතාව ආරම්භ කරන කොටස නිරන්තරයෙන් ම වාගේ අපහසු ය. එහෙත් ගොත ගසා හෝ ආරම්භකර පසුව එය කවියක් ආකාරයට කියද්දි මටත් නොදැනීම වචන තාලයට ගලාගෙන විත් කතාව සම්පූර්ණයෙන් ම වාගේ අවසන් කළ හැකි වෙයි. ගුරුතුමියගේ විධානය නිසා ම හිතට දිරිය ගත් මා තාලයට එහි මුල් පරිච්ඡේදය ආරම්භ කළෙමි.

"බොහෝම හොඳයි දැන් හිඳගන්න.... කෝ තරිඳු නැගිටින්න" ගුරුතුමිය ඊළඟට මා අසල සිටි අනිත් කොල්ලාව නැගිට්ටුවෙන් පොතත් අතට ගෙන වීරයෙක් සේ නැගිට ගත් ඔහු මටත් කොලොප්පමට මෙන් මහා හයියෙන්, පැහැදිලිව, එකදු වචනයක්වත් වැරදීමට නොදී කියාගෙන ගියේ ය. මට ලැජ්ජා හිතුණේ ය. ඔහු සේ ම මටත් එක දිගට කියවිය නොහැක්කේ ඇයි දැයි වේදනාවක් ඇති විය. මම ඉබේ ම වාගේ ඉදිරිපෙළ ආසනයේ හිඳගෙන සිටි ගුරුතුමියගේ දියණිය දෙස බැලුවෙමි. ඇය වපර ඇසින් මා දෙස බලාගෙන සිටියි. ඇයගේ එක ඇසක් ඇත්තේ මා දිහාවට ය. අනිත් ඇස පංතියේ එහා කොනට ය. මා ඇය දෙස බලත් ම ඈ අහක බලා ගත්තා ය.

තරිඳු පාඩම කියවා අවසන් කරත් ම "බොහෝම හොඳයි තරිඳු"

කියා ඔහුව පැසසූ ගුරුතුමිය පංතියේ සිටි සිසුන් සියල්ල ම දෙස බැල්මක් හෙළුවා ය. ඇයගේ දෑස්වල වූයේ කල්පනාවකි. ඒ බැල්ම ම මා දෙසටත් ගෙන ආ ඇය මගේ දෙසත් මොහොතක් බලා සිට පංතියේ පිටුපස ම සිටි ජිනාව පංතිය ඉදිරියට කැඳවූවා ය.

"හා දැන් ජිනා මේ කොටස කියවන්න" ඇය ජිනාට කීවෙන් ජිනා ලැජ්ජාවෙන් ඇඹරෙන්නට විය.

"කෝ ඉතින් පටන් ගන්න" ගුරුතුමිය වේවැල ජිනා හිටගෙන සිටි පැත්තට වනන්නට වූයෙන් ජිනා පොත අතට ගෙන දෑස් තුළට ඔබා ගත්තේ වෙන කරන්නට ම දෙයක් නොමැති කමිනි.

"ටීච මූ දෙමළ" පංතියේ අන්තිම පේළියේ සිටි තවත් කොල්ලෙක් කෑ ගැසුවේ ය.

"දෙමළ වුණාට සිංහල කියවන්න පුළුවන්නේ, කියවන්න" ගුරුතුමිය සැර කළා ය.

ජිනා අදිමදි කරමින් තුන්වෙනි පරිච්ඡේදය පටන් ගත්තේ දෙමළ සිංහල මිශ්‍ර කරන්නකු ලෙසිනි.

පංතියේ සිටි කොල්ලන්ගේ උසුළු විසුළු මැද්දේ පරිච්ඡේදය ලහි ලහියේ කියවා අවසන් කළ ජිනා කරබාගෙන යළිත් යන්නට සැරසුණේ ය.

"ජිනා පොඩ්ඩක් ඉන්නකෝ" ගුරුතුමිය කීයෙන් ඔහු එතැන ම නැවතුණේ ය.

"ජිනා මීට කලින් පසිඳු කතාව කියවද්දි හිනාවුණා නේද?" ඇය ඇසුවා ය.

දෙමළ වුවත් සුදු සමක් ඇති කොල්ලකු වූ ජිනාගේ මුහුණ එක් වර ම රතු වී ගියේ ය.

"හිනාවුණා ද නැද්ද?" ගුරුවරිය යළිත් ඇසුවා ය.

"හිනාවුණා ටීච"

"ඇයි හිනාවුණේ"

"ටීච, පසිඳු." ඔහු ඇසෙන නොඇසෙන හඬින් මුමුණන්නට විය.

"ඇයි පසිඳු මොකක්ද ජිනා?"

"පසිඳු ගොතයි"

ඔහු එසේ පවසද්දි මගේ දෑස් ඉබේ ම කඳුළින් තෙත් වී යනු මට දැනුණේ ය. මා ගොතයෙක් බව ඇත්තකි. පංතියේ එවුන් එම ගොතය ගැන මට දස දහස් වාරයක් ම විහිළු කර ඇති බවත් ඇත්තකි. එහෙත් මේ ආකාරයෙන් කොලුවකු පංතියේ හැමෝම ඉදිරියේ මා ගොතයකු බැව් කීයේ පළමු වතාවට ය. ඇස්වලට ඉනූ කඳුළුත් සමඟ මම බිම බලා ගත්තෙමි.

"කෝ පසිඳුත් මෙතැනට එන්න" ගුරුවරිය මට අඬගසන්නට විය. මා ආසනයෙන් නැගිට්ටේ වාරුවෙනි. මගේ දෑස්වලට එබී තිබුණු කඳුළු කොල්ලන් දකීවීයි බියෙන් මා මුහුණත් පහතට නවාගෙන ගුරුවරිය අසලට ගමන් කළෙමි.

"කෝ අර පසිඳු කවියක් කියනවයි කියපු ළමයා... එයත් මෙතැනට එන්න" ගුරුවරිය පන්තියේ පිටුපස ම පේළියේ සිටි තවත් කොල්ලකුට වේවැල දික් කළා ය. ඔවුත් විත් මා අසල ම සිට ගත්තේ ය. ගුරුවරිය සිංහල පොතේ ම තිබුණු විමලරත්න කුමාරගම කවියාගේ කුඩා කවි පංතියක් ඇති පිටුවක් පෙරළා පොත ඔහු අත තැබුවා ය.

"ආ, ඔය ළමයා මේ කවි පංතිය තාලයට කියන්න බලන්න"

ගුරුතුමිය එසේ පවසද්දී පංතියේ සිටි සියල්ලෝ ම කොක් හඬලා සිනා සෙන්නට වූවෝ ය. මගේ මුහුණෙන් ද සිනහවක් මතුවූයේ නිරායාසයෙනි. පොත අතට ගත් කොලුවා මා සේ ම ගොත ගසන්නට පටන් ගත්තේ ය.

"ථී...ච්..ච මම...."

"ඔව්...ඔයා තමයි... ඇයි දැන් පසිඳුගේ ගොතේ ඔය ළමයට බෝ වුණා ද?" ගුරුතුමිය ඇසුයෙන් පංතියේ එවුන් මෙවර කලින්ටත් වඩා හයියෙන් සිනාසුණෝ ය.

"මට කවි කියන්න බැහැ ටීච"

"කමක් නැහැ පුළුවන් විදියට කියමු, ආ පටන් ගමු" ගුරුතුමිය කීවෙන් ඔහු ද අදි-මදි කොට කවිය කියන්නට පටන් ගත්තේ ය.

ඔහු කවිය කිව්වේ කතාන්තරයක් කියන්නාක් මෙන් එක පේළියට ය. ළමුන් ඔහුට තවත් සිනහසෙන්නට විය.

"ටීච, අර සමනයත් හිනාවෙනවා" කවිය කියවා අවසන් වන තුරු ම තමන්ට සිනහවෙන අනිත් එවුන්ගේ මුහුණවල් දෙස බලමින් ඔවුන්ට එරවූ කොලුවා කවිය කියා අවසන් වෙත් ම ගුරුතුමියට ගතු කියන්නට පටන් ගත්තේ ය.

"හිනාවුණාදෙන්, ඔයත් පසිඳුට හිනාවුණේ, කෝ ඔයා පසිඳුට හිනාවුණාට ඔයාට කව් කියන්න බැහැනේ, පසිඳු කතාව කවියක් වගේ කිව්වා ඔයා කවිය කතාවක් වගේ කිව්වා... එහෙම නේද ළමයි" ගුරුතුමිය සිසුන් දෙස බලා ඇසුවා ය.

"ඔව් ටීච" සියල්ලෝ ම කීවෝ ය.

"ඒකනේ. එතකොට ඔයා පසිඳුට හිනාවුණාට එයා කරපු දේ ඔයාට කරන්න බැහැ. ජිනාත් එහෙමනේ" ගුරුතුමිය ජිනා දෙසට හැරුණා ය. "ජිනා පසිඳුට විහිළු කළාට ජිනා කියවද්දි ළමයි සේරම ජිනාට හිනාවුණා"

ජිනා ඔහුගේ රතු වූ මුහුණ තවත් ඇඹුල්කර ගත්තේ ය.

"දැක්කනේ ළමයි, පසිඳුට කරන්න පුළුවන් දේ ජිනාට කරන්න බැහැ, ජිනාට කරන්න පුළුවන් දේ පසිඳුට කරන්න බැහැ. ඔය හැමෝමත් එහෙමයි. එක්කෙනෙක්ට කරන්න පුළුවන් දේ අනිත් කෙනාට කරන්න බැහැ. ඉතින් ඕගොල්ලෝ කොහොමද තවත් කෙනෙක්ට හිනා වෙන්නේ?" ගුරුතුමිය ඇසූයෙන් පංතියේ සිටි සියල්ලෝ ම මීයට පිම්බාක් මෙන් නිහඬ වූවෝ ය. ගුරුතුමිය ඊළඟට ඇයගේ දියණියව පංතිය ඉදිරියට අඬගැසුවා ය.

"දුව මෙහෙ එන්නකෝ"

ඇය ගවොමත් හරිගස්සමින් පංතිය ඉදිරියට විත් හිටගත්තා ය.

"මේ මගේ දුව. එයා ලස්සනයි නේ" ගුරුතුමිය පංතියේ සිටි හැමෝම ඉදිරියේ දි ඇසූයෙන් පංතියේ ළමෝ සිනහසුණෝ ය. ගුරුතුමියත්, ඇයගේ දියණියත්, දෙදෙනාමත් එකිනෙකා දෙස බලමින් සිනාසුණෝ ය.

"ඔව් ටීච" පංතිය තුළින් ආයේ මුකුළුවකි.

"පුංචි අඩුපාඩුවක් තියෙනවා තමයි. එහෙත් මගේ දුව ලස්සනයි. පසිඳුත් එහෙමයි. වචන පිට කරන්න අමාරු වුණාට අඩු ම තරමින් පසිඳුට ලස්සනට කවි කියන්නවත් පුළුවන්නේ. එතකොට ජිනා, සමහර දෙමළ ළමයින්ට සිංහල වචනයක්වත් බැහැනේ ළමයි. එහෙත් ජිනා කැඩිච්ච සිංහලෙන් හරි කතා කරනවනේ, ඉතින් මේ හැමෝම පොඩි පොඩි අඩුපාඩු තිබුණත් කොයි තරම් සම්පූර්ණ ද නේද?" කී ගුරුතුමිය අප සියල්ලන්ව ම යළිත් පුටුවලට යැව්වා ය.

"ළමයි, අපි කවුරුවත් අංග සම්පූර්ණ නැහැ. අපිට හිතෙන්න පුළුවන් අපි අංග සම්පූර්ණයි කියලා; එහෙත් හරියට ම බැලුවොත් අපි කවුරුවත් අංග සම්පූර්ණ නැහැ. අපි හැමෝම ළඟ මොකක් ම හරි අඩුපාඩුවක් තියෙනවා. ඒ නිසා මීට පස්සේ කාටවත් ම හිනා වෙන්න එපා හොඳ ද"

ගුරුතුමිය පංතියේ ළමෝ දෙස ඇයගේ සුපුරුදු කරුණාවන්ත බැල්මෙන් බැලුවා ය. ළමුන් කිසිවක් කීවේ නැත. ඔවුන් සියල්ලෝ ම නිහඬව තමන් කළ වරද ගැන සිතන්නට ඇත.

"පිපිලා තියෙන මල් වුණත් එක එක සුවඳනේ ළමයි. ඔයාලත් එහෙමයි" ඇය කීවා ය.

✷✷✷

එදින මම නිවසට ගියේ සර්ව සම්පූර්ණ දරුවකු මෙන් සතුටින් යුක්තව ය. මෙතෙක් කල් මගේ සිතේ මා ගැන තිබුණු එම අඩ සම්පූර්ණ අදහස මගේ සිතින් ඉවත් වෙමින් තිබුණේ ය. ඒ වෙනුවට මමත් අනෙක් ළමුන් සේ ම සර්ව සම්පූර්ණ බවත්, හැමෝම අංග සම්පූර්ණ නොවන බැවින් මමත් එසේ වන බවත් සිතමින් මම හුදකලා සතුටක් ලබන්නෙක් වූවෙමි.

ගෙදරට ගිය පසුව මම වෙනදාටත් වඩා හොඳින් කතා කරන්නට පටන් ගත්තෙමි. ගුරුතුමියගේ ඔවදන් හමුවේ මගේ ආත්ම විශ්වාසය තවත් වැඩි වන්නට ඇත.

"ආච්චි පංතියේ ටීච කිව්වා ගොත ගැහුණට කමක් නැහැ කියලා" මම මගේ ආච්චි නලීපා හුම්මට කීවෙමි. ඇය සාලයේ